ඉදිරිපත් කිරීම
සිසිර දිසානායක

# ශාකයයි සංස්කෘතියයි

## ඇසතු බෝ

"යස්ස මූලේ නිසිනොව
සබ්බාරි විජයං අකා
පතෙතා සබ්ඤදඤුතං සත්ථා
වන්දෙ තං බෝධි පාදපං"

බුද්ධ කාලයටත් පෙර සිටම භාරතීය සමාජයේ චිත්ත පාරිශුද්ධිය සඳහා බවුන් වැඩූ තවුසෝ රුක්ඛ මූලිකාංගය පිරීම උසස් ලෙස සැලකූහ. පසේ බුදුවරුද විවේක සුවයෙන් රුක් මුල කල් ගෙවූහ. හැම බුදුවරයෝම රුක්මුල හිඳ බවුන් වඩා නිවන් පසක් කළහ. පුලිල, සල්, නා, කුඹුක්, උන, සපු, නෙල්ලි, පලු, මහරි, දිඹුල්, ඇටඹ, නුග ආදී ශාකයන් අතීත බුදුවරුන්ට බෝධිය යූ බව

## "රන්වන් පාටින් දළුලන බෝධිය"

බෞද්ධ සාහිත්‍යයේ ඇතුලත් වේ. අනාගතයේ බුදුවන බවට සඳහන් වී ඇති මෛත්‍රීය බුදුන් වහන්සේ නා ගසක් මුලදී නිවන් අවබෝධ කරන බව අනාගත වංශ දේශනාවේ සඳහන් වෙයි. මෙ මහා භද්‍ර කල්පයේ සිවුවෙනුව බුදු වූ අප ගෞතම බුදුන් වහන්සේ ඇසතු ගසක් බෝ මැඩ කර ගත්හ.

බුද්ධ ගයාවේ එම ජය ශ්‍රී මහා බෝධිය ධර්මාශෝක රජතුමාගේ බිසව විසින් විනාශ කරවා දමන ලද බව සඳහන්ව ඇත. ඊට පෙර එහි දකුණු ශාඛාව සංඝ මිත්තා ස්ථවිරින් වහන්සේ විසින් සිරි ලකට වැඩම වනු ලැබ අනුරපුර මහ මෙවුනා උයනේ රෝපණය කළෙන් අද දක්වාත් නිරුපද්‍රිතව පවතී. සැවැත් නුවර දෙවුරම් වෙහෙර බිමේ බුද්ධ කාලයේදීම බුදුන් වහන්සේ ගේ උපදෙස් පරිදි ආනන්ද හිමියන්ගේ අනුග්‍රයෙන් එදා ආනන්ද බෝධිය රෝපණය විය. අනුරපුර ජය ශ්‍රී මහා බෝධියෙන් පල අටක් පැල කොට රෝපණය කළ අට පල මහා බෝධි ලංකාවේ දඹකොළ පටුන, තිවක්ක බමුණු ගම, ථූපාරාමය, කසුබ් ගිරි වෙහෙර, ප්‍රථමක චෛත්‍යය සෑගිරිය, කතරගම, චන්දන ගාම යන අට තැනෙක ඇතැයි සඳහන් වේ. ඊට අමතරව දෙතිස්පල මහා බෝධිද පිහිටුවා ඇත. දැන් බුඬ ගයාවේ ඇත්තෙත් බාරාණසී මූල ගාඩ කුටි විහාරය අසල ඇත්තේත් අනුරාධපුර බෝධියෙන් ගෙන ගොස් රෝපනය කළ බෝධි බව විශ්වාස කෙරේ.

මහා බෝධිය ලංකාවට වැඩම වූ දිනම ඒස මඟ මෙහි ආ ක්‍ෂත්‍රිය කුමාරවරු අට දෙනෙකුට විශේෂ තනතුරු පිරිනමා ඇත. එපමණක් නොව දෙවන පියතිස්ස මහ රජතුමා එදා ශ්‍රී ලංකා රජ්‍යයෙන් බෝධිය පිදූ බව සඳහන්ය. ඒ අනුව ලක් රජය ශ්‍රී මහා බෝධිය සතුය. එය සැමරීමක් වශයෙන් වාර්ෂිකව බෝධිය සුවඳ පැනින් නහවා සළු අන්ද-වා අබරණ පලඳවා රාජ්‍යාභිශේක පූජාව පැවැත්වේ. එමෙන්ම ප්‍රදේශයේ ගොවීහු වාර්ෂිකව අග්‍ර ශෂ්‍යයෙන් බෝධිය පුදති.

මහා බෝධි ශාඛාව ගෙන ආදා සිටම මේ දක්වා ඒ අනුසාරයෙන් සාහිත්‍යයක් ද ගොඩනැගී ඇත.

එළු මහා බෝධි වංශය
සිංහල මහා බෝධි වංශය
මහා බෝධි වංශ ග්‍රන්ථ පද විවරණය
ධර්ම ප්‍රදීපිකාව

වැනි සම්භාව්‍ය ග්‍රන්ථ පමණක් නොව ජනකවි පොත් ද පහළ විය. එම ජනකවි ග්‍රන්ථ අතර සිරිමා බෝ හෑල්ල බෝමැඩ අලංකාරය හා තාඹුගල නයිදේගේ සිරිමා බෝකවි වැනි නිබන්ධන ලියවී ඇත.

"දඹදිවෙන් ඔබ එර්දි බලයෙන්
        වැඩම කළ විට   බෝධි   සාමිනි
රළ ගොසින් ඉසපිට දරාගෙන
        අනුරපුරයට වැඩම   කරමිනි
එම සැනෙන් එර්දිවී ගොස් ඉඳ
        ගුවනෙ පිට වැඩ සිටි   එසාමිනි
මම වඳිමි මතු නිවන් දක්නට
        පිහිට සිරිමා බෝධි   සාමිනි"

"දෙතනේ රත්රන් කිරි එරෙනා   බෝ
කොතනේ වඳිතත් වට සිටිනා   බෝ
නිතිනේ සව්සිරි සත රකිනා   බෝ
හිතුනේ වඳිනට යමු සිරිමා   බෝ"

සාමාන්‍ය ජනතාව තුළ මහා බෝධිය පිළිබඳ ව ඇති වූ හිතකර ආකල්ප මෙබඳු ජනකවි තුලින් පැහැදිලි වන්නේය.

බෞද්ධ සිද්ධස්ථානයක මූලික අවශ්‍යතාවකි, බෝධිය. ඒ ගැන හංස සංදේශකරු මෙසේ පවසයි.



දුටුව පබෝදය වන සත සිත   නිබඳ
පවතින බෝ පුදවත් වෙසෙසින්   නොමඳ
මුනි පිරිබෝ කළ මුනිදාතුවෙන්   බඳ
සිරිමා බෝ දාගැබ් පැදකුණෙන්   වැඳ

මහාබෝධි උත්සවය පැවැත්වීමට පැරණි අවධිවල සිටම පැවති බවට සෙල්ලිපි වලින් පවා නිදසුන් ගත හැකිය.

සඬ වැනි මිහිඳුගේ මිහින්තලා සෙල්ලිපියේ

"සොමිනස් මහබෝ මඟුලෙහි පිළියට් එක් කලන්දක් ඉසා රුවනසුන් මහබෝ මගුලෙහි පිලියට් එක් කලන්දක් ඉසා"

දුටුගැමුණු, ධාතුසේන, අඹහෙරණ, සළමෙවන්, දෙටුතිස් වැනි රජවරු බෝධි ස්නාන පූජා පැවැත් වූ බව වංශ කථාවල සඳහන් වේ.

බෝ මැඩ වලට කෙරෙන උපහාරයක් වශයෙන් පැරණි රජ දරුවන් බෝධීන් වටා බෝධිඝර ඉදිකළ අවස්ථා ඇත. කුරුණෑගල දිශාවේ නිල්ලකගම බෝධිඝරය පැහැදිලි නිදසුනකි. බෝ ගසක අතු කැපීම පවා අකුසලයක් හැටියට සැදැහැතියෝ සැලකූය. සර්වඥ ධාතු නිදන් කළ චෛත්‍යයක් වැනි ගොඩනැගිල්ලකට අවහිරයක් නම් පමණක් බෝ අතු කැපීමට හැකිබව පිළිගැනීම විය. දාගැබ් තුළ නිධන් කළ නිධාන් වස්තු අතර රනින් රිදියෙන් නිමකළ බෝධි වෘක්ෂ තැන්පත් කර තිබුණු බව පෙනේ. අපේ අයගේ විවිධ ආභරණ වලට පවා බෝපත් හැඩය ගන්වා ඇත. උඩරට නළුවාගේ වෙස් තට්ටුවේද රිදීමය බෝපත් එල්වා ඇත. කුඩා දරුවන්ට පලඳනා පංචායුධ ආභරණයද බෝපත් හැඩය ගනී. වඩිම්බු ලෑලි වහල උළු ආදියේදී බෝ පතේ හැඩය අණුකරණය කෙරේ. ගල් කැටයම් අතරද බෝපත් හැඩතල දක්නට ඇත. ඉන්දියාවේ භාරුත් ථූපය වටා ඇති ගල් වැටේ ලංකාවට බෝධි ශාඛාව ගෙන ඒමේ ඓතිහාසික අවස්ථාව කැටයම් කොට ඇත. අමරදේවයන්ගේ -මහබෝ වන්නම" වැනි ගීතයන්ද බෝ සෙවන ඇසුරෙන් ගැයේ.

පුද්ගල නාමයන් තැබීමේදී පවා බෞද්ධයෝ බෝධය අමතක නොකළහ. සිරිසඟබෝ, අග්බෝ, බෝධිගුප්ත, බෝධිපාල, බෝනා, බෝධි පක්‍ෂ වැනි නම් භාවිතයේ පවති. එමෙන්ම බෝ කුඹුර, මාබෙ-ර්පිටිය, මාබෝ වල, බෝපත් ඇල්ල වැන් ස්ථාන නාමයෙන් බෝධිය හා සම්බන්ධය.

බ්‍රහස්පති ග්‍රහයාගේ විමානය බෝගස බව ජ්‍යොතිෂ ග්‍රන්ථවල සඳහන් වෙයි. සිංහල අවුරුදු දිනවල මුලින්ම ඉසතෙල් ගෑමේදී බ්‍රහස්පතින්දා දිනයක නම් ඉසට ඉහළින් බෝකොළ එල්ලන ලෙසත් බෝපත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කරන ලෙසත් උපදෙස් ලැබේ.

බෝ (ඇසතු) ආයුර්වේද ඖෂධයෙකි. බෝ පොතු සර්ප විෂහරණය සඳහා යොදාගැනේ. බෝ මුල් ඉස්ම රාජතරංගනී වැනි ඔසුතෙල් සිඳිනු සඳහා භාවිතයට ගැනේ. ඇතැම් බෙහෙත් තෙල් සිඳීම බෝ ගසක් යටදී ඉටුකරන ලෙස නියම කොට ඇත. බෝ ගසේ දළුද ඔසු සඳහා යොදා ගැනේ.

කුඹුරු වල අස්වනු සරුකර ගැනීම සඳහා බෝ මැඩ වෙත අළුත් සහල් මංගල්‍යය (අග්‍ර ශස්‍ය පූජාව) පැවැත්වීම වාර්ෂිකව නුවර කලාවිය වැනි පෙදෙස්වල සිදුකෙරේ. මල්, පහන්, පැන්, සුදුවැලි, කිරි, ධාන්‍ය, කොඩි ආදියෙන් බෝ සමිඳුන් පිදීමට මිනිසුන් යොමුවී ඇත්තේ පරලොව සඳහාම නොව මෙලොව සැප සම්පත් සඳහාය. උපද්‍රව වලින් දුරුවීමේ අරමුණ ඇතිවය. ග්‍රහ අපල වැනි දෙයින් මිදීමට බෝධිපූජා පැවැත්වීමට අපි යුහුසුලු වෙමු. මහත් හාස්කම් ඇතැයි විශ්වාස කෙරෙන බෙල්ලන්විල, ගැටඹේ, කළුතර වැනි බෝධීන් වෙත දුර බැහැර සිට දිනපතා දහස් ගණන් සැදැහැවතුත් පැමිණෙන්නේ එබඳු අවංක විශ්වාස හා ප්‍රර්ථනා ඇතිවය.

ඇසතු බෝ ගස අපේ ජාතික සංස්කෘතිය හැඩ ගැස්වීමේ ලා මෙසේ නන් අයුරින් විශාල මෙහෙයක් කරන බව පැහැදිලිය.

### ලේඛකයා පිළිබඳව.....



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

ශාකයයි සංස්කෘතියයි" ලිපි පෙලෙහි කතුවරයා ශාස්ත්‍රවේදී නා.ලි. සාර්ලිස් අමරසිරි විශ්‍රාමික විදුහල්පතිවරයායි. මින් පෙර සන්නස මාසිකයේ පළවූ "සීතාවක පුරාණය" ලිපි පෙළ සකස් කරගත් එනමින් වන ග්‍රන්ථයේ කතුවරයායි එතුමාණන්.

අවිස්සාවේල්ලේ තල්දූවේ ඉපිද පසු කලෙක අවිස්සාවේල්ල සීතාවක මධ්‍ය මහා විද්‍යාලය, ගලපිටමඩුව, වළගම්බා මහා විද්‍යාලය, අටුළුගම මයාදුන්න මහා විද්‍යාලය වැනි විද්‍යාලවල විදුහල්පති තනතුරු දැරූ සාර්ලිස් අමරසිරි ගුරු පියාණන් බොහෝ අංශවලින් හපන්කම් පාන ප්‍රදේශයේ ප්‍රභූවරයෙකි.

පේරාදෙණිය සරසවි පියසේදී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් සෙවනේ එම නිර්මාණ වෙනුවෙන් තාල වාද්‍ය භාණ්ඩ වයමින් ද, සෙනරත් පරණවිතාන පුරා විදු ඇදුරුතුමන් සෙවනේ සීතාවක රාජධානිය පිළිබඳව පර්යේෂන කරමින් ග්‍රන්ථ ලියමින් ද, දක්ෂ ලී කැටයම් ශිල්පියෙකු වශයෙන්ද කවියෙකු වශයෙන් ද, චිත්‍ර ශිල්පියෙකු වශයෙන් ද කලා හපන්කම් පාන් ඒ මහත්මා පාසැල් ළමුන් වෙනුවෙන් "සම්බුලා" වැනි වේදිකා නාට්‍ය හා ගුවන් විදුලි නාට්‍ය ද නිර්මාණය කළේය. වෙද පරපුරකින් පැවතගෙන එන සිය මෑණියන් ඇසුරෙන් මේ වන විට ප්‍රදේශයේ දක්ෂ වෛද්‍ය වරයකු හා නක්ෂත්‍ර ඇදුරෙකු ද වන ඒ මහත්මා කෙටි කලක් වාමාංශික දේශපාලනයට ද සම්බන්ධව සිය ගම් ප්‍රදේශයට අගනා මෙහෙවරක් කළේය.

**කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන්ගේ වික්ටෝරියානු සංගමයේ 2011/2012 මහා සභා රැස්වීම**

2011 ඔක්තෝබර් 16 වන ඉරිදා
සවස 3.30 ට

Mount Street Neighbourhood House
6 Mount Street, Glen Waverly (Melway71D2)

වික්ටෝරියාවේ වෙසෙන කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම උපාධිධාරීන්ට සහ හිටපු කාර්ය මණ්ඩලයට කරන ආරාධනයයි

වැඩි විස්තර
සේනක - 98014356
අමෝදා - 9755 5373
හෝ www.cuaav.org.au වෙබ් අඩවියෙන්